

ශ්‍රී බුද්ධ වර්ෂ 2562-2563

රාජ්‍ය වර්ෂ 2019

# බුදු සරණ

## දෙලොස් මහේ පොහොය වරුණ

### දුරුතු පසළොස්වක පොහොය

තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සිදුවූයේ ඓතිහාසික දුරුතු පෝ දිනක ය. තුන් බෑ ජටිලයන් ප්‍රධාන දහසක් සව්වන් සදහම් මඟට හරවා ඔවුන් හැම අරි සඟ ගණ බවට පත්කොට වදාළ බුදුපියාණන් වහන්සේ අනතුරුව හෙළදිව බිම් තැන්නේ මහවැලි ගඟ අසබඩ මිනිපේ නම් සරු දනව් පියසට ගුවන් ගැබින් පහළව සවනක් බුදුරැස් මාලාවන්ගෙන් දිලිහී වැඩහුන් සේක.

### නවම් පසළොස්වක පොහොය

සැරියුත් මුගලන් දෙනම අගසව් තනතුරු ලබන ලද්දේ ද, සම්බුද්ධ ශාසනවංශ කතාවෙහි ප්‍රථම මහා සංඝ සන්නිපාතය සිදුවූයේ ද නවම් පුන් පොහෝ දිනක ය.

### මැදින් පසළොස්වක පොහොය

ලෝකාර්ථචර්යාවෙහි යෙදුණු බුදුන්වහන්සේ විසි දහසක් මහ සඟරුවන සමඟ රජගහනුවර සිට තමන් වහන්සේගේ උපන් ගම වූ කිඹුල්වත්පුරයට ගමනාරම්භ කළේ මැදින් පෝදක ය.

### බක් පසළොස්වක පොහොය

බුදුපියාණන් වහන්සේගේ මහා ගුණ කඳ මනසට නංවන අසිරිමත් දිනයකි, බක් පොහොය දිනය. මේ සුන්දර දිවයින දෙවැනිවරටත් බුදු සිරිපා පහසින් පිවිතුරු බවට පත් වූයේ ද, බුදුරජාණන් වහන්සේගේ සවනක් රැස් කඳින් නාගදීපය ආලෝකවත් වූයේ ද, දහම් අමා මිහිරෙන් නොයෙක් දෙනා නිවී සැනසී ගියේ ද බක් පුර පොහෝ දිනක දී ය.

### වෙසක් පසළොස්වක පොහොය

තිලොවග සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ලොව පහළවීම, බුදුවීම, පිරිනිවන් පෑම යන අසිරිමත් මංගල කරුණු රැසකින් පූජනීයත්වයට, ඓතිහාසිකත්වයට පත්වුණු ශ්‍රී වෛශාඛ දිනය සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පරම පූජනීය දිනයයි.

### පොසොන් පසළොස්වක පොහොය

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ දඹදිව් තලයේ සිට හෙළ දිව් තලයේ මිස්සක පව්වට සදහම් පණිවුඩය රැගෙන වැඩම කළ ඓතිහාසික දිනය පොසොන් පොහොය දිනයයි.

## 2019 පෝය ලබන ගෙවෙන වේලාවන් සහ සිල් සමාදන් විය යුතු දවස්

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **උඳුවප් මස පෝය** | | | | | | | |
| ජන 05 | සෙන පූ.භා | 04.57 න් | අමාවක ලබා | 06 ඉරිදු | පූ.භා 06.58 න් | ගෙවේ | සෙන සිල් |
| **දුරුතු මස පෝය** | | | | | | | |
| ජන 13 | ඉරිදු අ.භා | 11.42 න් | පුර අටවක ලබා | 15 අඟහ | පූ.භා 00.37 න් | ගෙවේ | සඳුදු සිල් |
| ජන 20 | ඉරිදු අ.භා | 02.19 න් | පසළොස්වක ලබා | 21 සඳුදු | පූ. භා 10.45 න් | ගෙවේ | ඉරිදු සිල් |
| ජන 27 | ඉරිදු අ.භා | 03.02 න් | අව අටවක ලබා | 28 සඳුදු | අ.භා. 02.29 න් | ගෙවේ | ඉරිදු සිල් |
| පෙබ 03 | ඉරිදු අ.භා | 11.52 න් | අමාවක ලබා | 05 අඟහ | පූ.භා 02.33 න් | ගෙවේ | සඳුදු සිල් |
| **නවම් මස පෝය** | | | | | | | |
| පෙබ 12 | අඟහ අ.භා | 03. 54 න් | පුර අටවක ලබා | 13 බදාදු | අ.භා 03.46 න් | ගෙවේ | අඟහ සිල් |
| පෙබ 19 | අඟහ පූ.භා | 01.11 න් | පසළොස්වක ලබා | එමදු | අ.භා. 09.23 න් | ගෙවේ | අඟහ සිල් |
| පෙබ 26 | අඟහ පූ.භා | 04.46 න් | අව අටවක ලබා | 27 බදාදු | පූ.භා. 05.20 න් | ගෙවේ | අඟහ සිල් |
| මාර් 05 | අඟහ අ.භා | 07.07 න් | අමාවක ලබා | 06 බදාදු | අ.භා 09.33 න් | ගෙවේ | බදාදු සිල් |
| **මැදින් මස පෝය** | | | | | | | |
| මාර්තු 14 | බ්‍රහස් පූ.භා | 04.23 න් | පුර අටවක ලබා | 15 සිකුරා | පූ.භා 03.21 න් | ගෙවේ | බ්‍රහස් සිල් |
| මාර් 20 | බදාදු පූ.භා | 10.44 න් | පසළොස්වක ලබා | 21 බ්‍රහස් | පූ.භා 07.12 න් | ගෙවේ | බදාදු සිල් |
| මාර් 27 | බදාදු අ.භා | 08.55 න් | අව අටවක ලබා | 28 බ්‍රහස් | අ.භා 10.34 න් | ගෙවේ | බ්‍රහස් සිල් |
| අප්‍රේ 04 | බ්‍රහස් අ.භා | 12.51 න් | අමාවක ලබා 05 | සිකුරා | අ.භා. 02.20 න් | ගෙවේ | බ්‍රහස් සිල් |
| **බක් මස පෝය** | | | | | | | |
| අප්‍රේ 12 | සිකුරා අ.භා | 01.23 න් | පුර අටවක ලබා | 13 සෙන | පූ.භා 11.41 න් | ගෙවේ | සිකුරා සිල් |
| අප්‍රේ 18 | බ්‍රහස් අ.භා | 07.26 න් | පසළොස්වක ලබා | 19 සිකුරා | අ.භා. 04.42 න් | ගෙවේ | සිකුරා සිල් |
| අප්‍රේ 26 | සිකුරා අ.භා. | 02.40 න් | අව අටවක ලබා | 27 සෙන. | අ.භා 05.01 න් | ගෙවේ | සිකුරා සිල් |
| මැයි 04 | සෙන අ.භා. | 04.03 න් | අමාවක ලබා | 05 ඉරිදු | පූ.භා 04.15 න් | ගෙවේ | සෙන සිල් |
| **වෙසක් මස පෝය** | | | | | | | |
| මැයි 11 | සෙන අ.භා | 07.44 න් | පුර අටවක ලබා | 12 ඉරිදු | අ.භා 05.37 න් | ගෙවේ | ඉරිදු සිල් |
| මැයි 18 | සෙන පූ.භා | 04.10 න් | පසළොස්වක ලබා | 19 ඉරිදු | පූ.භා 02.41 න් | ගෙවේ | සෙන සිල් |
| මැයි 26 | ඉරිදු අ.භා | 08.49 න් | අව අටවක ලබා | 27 සඳුදු | පූ.භා 11.16 න් | ගෙවේ | ඉරිදු සිල් |
| ජූනි 02 | ඉරිදු අ.භා | 04.40 න් | අමාවක ලබා | 03 සඳුදු | අ.භා 03.31 න් | ගෙවේ | ඉරිදු සිල් |
| **පොසොන් මස පෝය** | | | | | | | |
| ජූනි 10 | සඳුදු පූ.භා | 00.36 න් | පුර අටවක ලබා | එමදු | අ.භා 10.23 න් | ගෙවේ | සඳුදු සිල් |
| ජූනි 16 | ඉරිදු අ.භා. | 02.02 න් | පසළොස්වක ලබා | 17 සඳුදු | අ.භා 02.00න් | ගෙවේ | ඉරිදු සිල් |
| ජූනි 25 | අඟහ පූ.භා | 02.12 න් | අව අටවක ලබා | 26 බදාදු | පූ.භා. 04.13 න් | ගෙවේ | අඟහ සිල් |
| ජූලි 02 | අඟහ පූ.භා. | 03.05 න් | අමාවක ලබා | 03 බදාදු | පූ.භා. 00.46 න් | ගෙවේ | අඟහ සිල් |
| **ඇසළ මස පෝය** | | | | | | | |
| ජූලි 09 | අඟහ පූ.භා | 05.24 න් | පුර අටවක ලබා | 10 බදාදු | පූ.භා 03.30 න් | ගෙවේ | අඟහ සිල් |
| ජූලි 16 | අඟහ පූ.භා | 01.48 න් | පසළොස්වක ලබා | 17 බදාදු | පූ.භා 03.08 න් | ගෙවේ | අඟහ සිල් |
| ජූලි 24 | බදාදු අ.භා | 06.05 න් | අව අටවක ලබා | 25 බ්‍රහස් | අ.භා. 07.21 න් | ගෙවේ | බ්‍රහස් සිල් |
| ජූලි 31 | බදාදු පූ.භා | 11.57 න් | අමාවක ලබා | 01 බ්‍රහස් | පූ.භා. 08.41 න් | ගෙවේ | බදාදු සිල් |
| **නිකිණි මස පෝය** | | | | | | | |
| අගෝ 07 | බදාදා පූ.භා | 11.40 න් | පුර අටවක ලබා | 08 බ්‍රහස් | පූ.භා 10.30 න් | ගෙවේ | බදාදු සිල් |
| අගෝ 14 | බදාදු අ.භා | 03.45 න් | පසළොස්වක ලබා | 15 බ්‍රහස් | අ.භා 05.59 න් | ගෙවේ | බදාදු සිල් |
| අගෝ 23 | සිකුරා පූ.භා | 08.09 න් | අව අටවක ලබා | 24 සෙන | පූ.භා. 08.32 න් | ගෙවේ | සිකුරා සිල් |
| අගෝ 29 | බ්‍රහස් අ.භා | 07.55 න් | අමාවක ලබා | 30 සිකුරා | අ.භා 04.07 න් | ගෙවේ | සිකුරා සිල් |
| **බිනර මස පෝය** | | | | | | | |
| සැප් 05 | බ්‍රහස් අ.භා | 08.49 න් | පුර අටවක ලබා | 06 සිකුරා | අ.භා 08.42 න් | ගෙවේ | සිකුරා සිල් |
| සැප් 13 | සිකුරා පූ.භා | 07.35 න් | පසළොස්වක ලබා | 14 සෙන | පූ.භා 10.02 න් | ගෙවේ | සිකුරා සිල් |
| සැප් 21 | සෙන අ.භා | 08.20 න් | අව අටවක ලබා | 22 ඉරිදු | අ.භා 07.50 න් | ගෙවේ | ඉරිදු සිල් |
| සැප් 28 | සෙන පූ.භා | 03.36 න් | අමාවක ලබා | එමදු | අ.භා 11.56 න් | ගෙවේ | සෙන සිල් |
| **වප් මස පෝය** | | | | | | | |
| ඔක් 05 | සෙන පූ.භා | 09.50 න් | පුර අටවක ලබා | 06 ඉරිදු | පූ.භා 10.54 න් | ගෙවේ | සෙන සිල් |
| ඔක් 13 | ඉරිදු පූ.භා | 00.36 න් | පසළොස්වක ලබා | 14 සඳුදු | පූ.භා 02.37 න් | ගෙවේ | ඉරිදු සිල් |
| ඔක් 21 | සඳුදු පූ.භා | 06.44 න් | අව අටවක ලබා | 22 අඟහ | පූ.භා 05.25 න් | ගෙවේ | සඳුදු සිල් |
| ඔක් 27 | ඉරිදු අ.භා | 12.23න් | අමාවක ලබා | 28 සඳුදු | පූ.භා 09.08 න් | ගෙවේ | ඉරිදු සිල් |
| **ඉල් මස පෝය** | | | | | | | |
| නොවැ 04 | සඳුදු පූ. භා | 02.56 න් | පුර අටවක ලබා | 05 අඟහ | පූ.භා 04.57 න් | ගෙවේ | සඳුදු සිල් |
| නොවැ 11 | සඳුදු අ.භා | 06.01 න් | පසළොස්වක ලබා | 12 අඟහ | අ.භා 07.04 න් | ගෙවේ | අඟහ සිල් |
| නොවැ 19 | අඟහ අ.භා | 03.35 න් | අව අටවක ලබා | 20 බදාදු | අ.භා 01.41 න් | ගෙවේ | අඟහ සිල් |
| නොවැ 25 | සඳුදු අ.භා | 10.40 න් | අමාවක ලබා | 26 අඟහ | අ.භා 08.35 න් | ගෙවේ | අඟහ සිල් |
| **උඳුවප් මස පෝය** | | | | | | | |
| දෙසැ 03 | අඟහ අ.භා | 11.14 න් | පුර අටවක ලබා | 05 බ්‍රහස් | පූ.භා 01.44 න් | ගෙවේ | බදාදු සිල් |
| දෙසැ 11 | බදාදු පූ.භා | 10.59 න් | පසළොස්වක ලබා | 12 බ්‍රහස් | පූ.භා. 10.42 න් | ගෙවේ | බදාදු සිල් |
| දෙසැ 18 | බදාදු අ.භා | 11.30 න් | අව අටවක ලබා | 19 බ්‍රහස් | අ.භා 09.23 න් | ගෙවේ | බ්‍රහස් සිල් |
| දෙසැ 25 | බදාදු පූ.භා | 11.17 න් | අමාවක ලබා | 26 බ්‍රහස් | පූ.භා. 10.42 න් | ගෙවේ | බදාදු සිල් |

## දෙලොස් මහේ පොහොය වරුණ

### ඇසළ පසළොස්වක පොහොය

බරණැස ඉසිපතනාරාමයේ දී දුකත්, දුකට හේතුවත්, නිවනත්, එය ලබන පිළිවෙතත් යන සත්‍යසතර ලොව පළමුවරට දේශනා කළ දිනයයි, ඇසළ පෝදා.

### නිකිණි පසළොස්වක පොහොය

ඇසළ අව පෑළවිය ද භික්ෂූන් වහන්සේ පෙර වස් එළඹීමට නියමිත දිනයකි. නිකිණි පසළොස්වක පොහෝදා පොහොය කොට නිකිණි අව පෑළවිය පසුවස් එළඹීමයි, සසුන් පිළිවෙත වන්නේ.

### බිනර පසළොස්වක පොහොය

බුද්ධ නියමය අනුව භික්ෂූන් වහන්සේ විහාරාරාමයන්හි නිබඳව වස් වසමින් බණ භාවනාවල යෙදෙමින් සම්බුද්ධ ශාසන පරමාර්ථ ඉටු කරගන්නා කාලයකි. මෙහෙණ සසුනේ ආරම්භය සිදු විය.

### වප් පසළොස්වක පොහොය

වස්සාන සෘතුවේ මුල් තුන් මස භික්ෂූන් වහන්සේ වස් වසා වැඩ සිටින කාලයයි. වස් සාර මාසයේ අන්තිම මාසය කඨින චීවර පූජා මාසයයි.එය චීවර මාසය නමින් ද ව්‍යවහාර කැරේ.

### ඉල් පසළොස්වක පොහොය

ශාසන ඉතිහාසයේ අනුස්මරණීය සිද්ධීන් කීපයකට මුල් වූ පොහොය දිනයකි. මෙතේ බෝසත්තුමා විවරණය ලැබීම, ප්‍රථම රහතන් වහන්සේ හැට නම ධර්ම ප්‍රචාරය සඳහා ගමන් ඇරඹීම, පසු වස් පවාරණය කළ යුතු දිනය ද, සැරියුත් මහරහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවීම ද යන කරුණු රැසක් අනුස්මරණය කැරෙන්නේ ඉල් පෝදා ය.

### උඳුවප් පසළොස්වක පොහොය

උඳුවප් පොහොය දින සිදු වූ සංඝමිත්තා මහ රහත් මෙහෙණින් වහන්සේගේ ලංකාගමනය ගැන, ජය ශ්‍රී මහා බෝ සමිඳුන් ගැන, ලංකා මෙහෙණ සසුන ගැන සිහිකරන කවර අයකුට වුව ද ඇති වනුයේ මහා සැනසිල්ලකි.

SAMAN SRIKANTHA

වර්ෂ 2019 ක් වූ ජනවාරි 05 වනදා සෙනසුරාද කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.